**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය**

**නීති අධ්‍යයනාංශය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - සිව්වන මට්ටම**

# LWU2311/LLU4805 ගිවිසුම් නීතිය

**අවසාන පරීක්ෂණය - 2020/2021**

**කාලය පැය (3) තුන යි**

---

**දිනය: 2021 සැප්තැම්බර් 12** **වේලාව: පෙ. ව. 9.30 - ප. ව. 12.30**

---

**සාමාන්‍ය උපදෙස්**

ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සහ ප්‍රශ්න **හයකින් (6)** සමන්විත වෙයි. **I කොටස** ප්‍රශ්න දෙකකින් සමන්විත වන අතර **II කොටස** ප්‍රශ්න හතරකින් සමන්විත වෙයි.

**I කොටසින්** **<u>ප්‍රශ්න එකක් (1) පමණක්</u>** තෝරාගනිමින් **<u>ප්‍රශ්න හතරකට (4)</u>** පිළිතුරු සපයන්න.

එක් ප්‍රශ්නයකට ලකුණු **25** බැගින් හිමිවෙයි.

---

## I කොටස

---

I කොටස සඳහා විශේෂ උපදෙස්

I කොටසින් ඔබට තෝරාගතහැක්කේ **<u>ප්‍රශ්න එකක් (1) පමණකි</u>**.

---

**1.** කුසල් සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ දෙවන වසර ශිෂ්‍යයෙකි. කුසල් තම විවේක කාලයේදී චිත්‍ර අඳින අතර තම අධ්‍යාපනය සඳහා වන වියදම් දැරීමට හැකියාවක් ඔහුගේ පවුලට නොමැති බැවින් එම චිත්‍ර විකිණීම ද කරයි. කුසල් තමාගේ චිත්‍රයක් විකිණීමට ධනුෂ්කව පත් කරයි. කුසල් විසින් ධනුෂ්කට පවසන්නේ කිසිඳු හේතුවක් මත රුපියල් 25,000 අඩුවෙන් චිත්‍රය නොවිකුණන ලෙසයි. කෙසේවුවත්, චිත්‍රයෙන් අවම වශයෙන් රුපියල් 35,000 වත් උපයා ගැනීමට කුසල් බලාපොරොත්තු වෙයි.

පහත එක් එක් විකල්ප අවස්ථාවලදී පාර්ශවයන්ගේ වගකීම සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර නඩු තීන්දු නිදර්ශන මගින් තහවුරු කරන්න.

a) ධනුෂ්ක රුපියල් 15,000ක මුදලකට චිත්‍රය තනුජාට විකුණයි.

**(ලකුණු 12)**

b) ධනුෂ්ක තමා විසින්ම රුපියල් 25,000ක මුදලකට චිත්‍රය මිලටගෙන පසුව එය රුපියල් 30,000ක මුදලකට සමන්ට විකුණයි.

**(ලකුණු 13)**

**2.** රක්ෂණ නියෝජිතයකු වන නලින් ඇමතු සනී ඇගේ පෙම්වතා වන අශාන්ට අයත් අධිසුඛෝපභෝගී වාහනය නලින්ට හැකි මුල් අවස්ථාවේදීම රක්ෂණය කරන ලෙස ඉල්ලා සිටියා ය. නලින් ඒ අනුව මූලික කටයුතු ඉටු කළේ ය. මේ අතරතුර අශාන් ද වෙනත් නියෝජිතයකු වන ඇන්ගි සම්බන්ධ කරගනු ලැබූ අතර තම වාහනය ඇන්ගිගේ සමාගමෙහි රක්ෂණය කිරීමට එකඟ විය. එනමුත් සනී සතියකට පසුව මෙය දැනගත් අතර, ඇය නලින් අමතා තහවුරු කළේ වාහනය නලින්ගේ නියෝජිතායතනයේ රක්ෂණය කරනු ලබනු ඇති බවයි.

a) ප්‍රධානීන් ලෙස වගකීම් කඩ කළේ ය යන පදනම මත සනී සහ අශාන්ට එරෙහිව නඩුවක් පැවරීමට නලින් අදහස් කරයි. මෙකී නඩු කටයුත්ත කොතරම් දුරකට සාර්ථකවනු ඇති ද? ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇත්නම් ඒවා සහ නඩු තීන්දු නිතිය ඇසුරින් තහවුරු කරන්න.

**(ලකුණු 13)**

b) සනී සහ අශාන් තමන්ට පවතින රක්ෂණයන් හෝ ප්‍රතිකර්ම මොනවාද යන්න පිළිබඳව ඔබෙන් උපදෙස් පතයි. ඔවුන්ට උපදෙස් දෙන්න.

**(ලකුණු 12)**

---

## II කොටස

### II කොටසින් ඔබට තෝරාගත හැක්කේ <u>ප්‍රශ්න තුනක් (3)</u> පමණකි

---

II කොටස සඳහා විශේෂ උපදෙස්

ඔබ කින්ග්ස්ලන්ඩ්හි මිල්ටන් විශ්ව විද්‍යාලයේ අභිනවයෙන් පත් කරන ලද නීති නිලධරයා වෙයි. ගිවිසුම්ක සම්බන්ධතා පිළිබඳ පහත දැක්වෙන නීති ගැටළු සම්බන්ධයෙන් උපදෙස්

ඇතුලත් ලේඛනයක් සකස්කරන ලෙස මිල්ටන් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා ඔබගෙන් ඉල්ලා තිබෙයි.

කින්ග්ස්ලන්ඩ්හි නීතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන බව උපකල්පනය කරන්න. එක් එක් නීති ගැටළු සම්බන්ධයෙන් අදාල නඩු තීන්දු නීතිය සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන (පවතී නම්) ඔබ විසින් උපුටා දැක්විය යුතුය.

---

**ප්‍රශ්න 3 සහ 4 පහත දැක්වෙන සිද්ධිමය සාධක මත පදනම් වෙයි.**

මිල්ටන් විශ්ව විද්‍යාලයේ නිර්මාණාත්මක කර්මාන්ත පීඨය (Faculty of Creative Industries) කින්ග්ස්ලන්ඩ්හි ජන ගී ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් තෙදින ප්‍රසංගයක් පැවැත්වීමට අදහස් කළේය. එඩී යනු නූතන සංගීත කර්මාන්තය තුළ ජන ගී යොදාගැනීම සම්බන්ධයෙන් ඇල්මක් සහිත කින්ග්ස්ලන්ඩ්හි වෙසෙන ප්‍රසිද්ධ ගායකයෙකි. නිර්මාණාත්මක කර්මාන්ත පීඨයේ සහකාර ලේඛකාධිකාරී විසින් 2021 ජනවාරි 1 දින ලිපියක් යවා ප්‍රසංගයේ අගෝස්තු 1 සිට අගෝස්තු 3 දක්වා සන්ධ්‍යා දර්ශනයන් තුනක ඉදිරිපත් කිරීම සඳහා එඩීට ආරාධනා කළේය. ආරාධනය මගින් රුපියල් 600,000 ගෙවීමක් සහ ප්‍රසංගයේ අවසාන දිනය රූපවාහිනියෙන් ප්‍රදර්ශනය කිරීමෙන් ලැබෙන අදායමෙන් 10% කොටසක් ද යෝජනා කළේය. එඩී 2021 ජනවාරි 5 දින ලිපියකින් පිළිතුරු යවා සඳහන්කර සිටියේ, තමා ඉදිරිපත් කිරීම සඳහා සතුටු බවත්, කෙසේවෙතත්, ඔහුට වැඩෙහි යෙදිය හැකිවන්නේ අගෝස්තු 2 හා 3 පමණක් බවත් ය. ජනවාරි 10 වන දින සහකාර ලේඛකාධිකාරී විසින් එඩීට ලියුමක් යවා යෝජනා කළේ ප්‍රසංගයේ අවසාන දින දෙකේදී ඔහුගේ සහභාගී වීම ගැන පීඨය සතුටු වන බවත්, ප්‍රසංගයෙහි පළමුවන වන දින, එනම් අගෝස්තු 1 ඉදිරිපත් කිරීම සඳහා වෙනත් තැනැත්තකු සොයාගත හැකි බවයි. ජනවාරි 13 එඩී ලිපියකින් පිළිතුරු සපයමින් සඳහන් කළේ 'මම ගනුදෙනුවට සතුටුයි' යනුවෙනි. ජනවාරි 16 වන දින සහකාර ලේඛකාධිකාරී විසින් ABC ප්‍රචාරණ සමාගමට රුපියල් 100,000 මුදලක් එකවර ගෙවා ජන ගී ප්‍රසංගය සඳහා වන ප්‍රචාරණ කටයුතු ආරම්භ කළේය. එඩී පෙබරවාරි 1 දින සහකාර ලේඛකාධිකාරී වෙත ලිපියක් යවා දැනුවත්කර සිටියේ ඔහු තමාගේ අදහස වෙනස් කරගත් බවත් තම මීළග ඇල්බමය වෙනුවෙන් වැඩ කිරීම වඩා වැදගත් යැයි ඔහු තීරණය කළ බවත් ය.

3. මිල්ටන් විශ්ව විද්‍යාලය එඩී සමග බන්ධනීය ගිවිසුමකට එළඹී ඇත්දැයි උපකුලපතිවරයා ඔබගේ උපදෙස් පතයි.

   ඔබගේ උපදේශය පිළියෙළ කරන්න.

**(ලකුණු 25)**

**4.** උක්ත සිද්ධිමය සාධක පිළිබඳව පහත අවස්ථා උපකල්පනය කොට එක් එක් අවස්ථාව සම්බන්ධයෙන් ඔබගේ උපදේශය පිළියෙළ කරන්න.

a) ලියුම් හුවමාරු කරගන්නා අවස්ථාව වන විට එඩීගේ වයස අවුරුදු 17 වුයේ නම් [ගිවිසුම්ක බැදීමේ] යම් වෙනසක් සිදුවිය හැකිද?

**(ලකුණු 7.5)**

b) ලියුම් හුවමාරු කරගන්නා අවස්ථාව වන විට කින්ග්ස්ලන්ඩ්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීමේ පනත මගින් ජන ගී මහජන ප්‍රදර්ශනය සඳහා යොදාගැනීම තහනම්කර පැවතියේ නම් [ගිවිසුම්ක බැදීමේ] යම් වෙනසක් සිදුවිය හැකිද?

**(ලකුණු 7.5)**

c) සහකාර ලේඛකාධිකාරී විසින් එඩීව ගිවිසුමට ඇතුලත් වීමට පොළඹවා ගැනීම සඳහා ප්‍රසංගයේ අවසාන දිනය රූපවාහිනියේ ප්‍රදර්ශනය කිරීම මගින් ලැබෙන අදායමින් 10% කොටසක් පිරිනැමීම පිළිබඳව අසත්‍ය ප්‍රකාශයක් කළේ නම් [ගිවිසුම්ක බැදීමේ] යම් වෙනසක් සිදුවිය හැකිද? මෙකී ප්‍රකාශය කිරීමේදී සහකාර ලේඛකාධිකාරී නොසැලකිලිමත්ව කටයුතුකර තිබුනේ නම් ඔබගේ උපදේශය වෙනස් වන්නේ ද?

**(ලකුණු 10)**

**ප්‍රශ්න 5 සහ 6 පහත දැක්වෙන සිද්ධිමය සාධක මත පදනම් වෙයි.**

මිල්ටන් විශ්ව විද්‍යාලය 2019 ජුලි 30 විශ්වවිද්‍යාලයට ශ්‍රවණාගාරයක් ඉදිකිරිම සඳහා සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන් (South Bank Constructions) සමග ගිවිසුමකට එළැඹිණි. මෙම ගිවිසුමේ 5 වන වගන්තියට අනුව සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන් ශ්‍රවණාගාරයේ ඉදිකිරීම 2021 ජුනි 30 දිනට පෙර අවසන් කළ යුතුය. කෙසේවුවත්, නියමිත දිනයට පෙර ශ්‍රවණාගාරයේ ඉදිකිරීම අවසාන කිරීමට සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන් අපොහොසත්ව ඇත. මිල්ටන් විශ්ව විද්‍යාලයේ පෙර සිටි නීති නිලධාරී විසින් සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන් වෙත එන්තරවාසියක් යවමින් චෝදනාකර තිබුනේ නියමිත දිනයට පෙර ශ්‍රවණාගාරයේ ඉදිකිරීම අවසාන කිරීමට අපොහොසත් වීම මගින් ඔවුන් [සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන්] ගිවිසුම උල්ලංඝනය කර තිබෙන බවත්, එනිසා ගිවිසුමේ 5 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාණ කළ අලාභ ගෙවීමට සමාගම වගකීමට බැඳෙන බවත් ය. එන්තරවාසියට පිළිතුරු සපයමින් සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන්හි නීති අංශය විසින් ඔවුන් නියමිත දිනයට පෙර ශ්‍රවණාගාරයේ ඉදිකිරීම අවසාන කිරීමට අපොහොසත් වුයේ ඇයිද යන්න පිළිබඳව පහත තොරතුරු ඉදිරිපත්කොට ඇත.

*COVID-19 තෙවන වරට පැතිරීමෙන් මිල්ටන් විශ්ව විද්‍යාලයයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම තදින්ම අවහිරතාවන්ට ලක්විය. තවදුරටත්, කින්ග්ස්ලන්ඩ් රජය විසින් 2021 අප්‍රේල් මස අවසානයේ දී පනවනු ලැබූ සංචරණ සීමා සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ නිසා ඉදිකිරීම් වැඩබිමෙහි අවශ්‍ය තරම් සේවක පිරිස පවත්වාගැනීමට සහ ඉදිකිරීම් කටයුතු කරගෙනයාමට අවශ්‍ය ද්‍රව්‍ය සපයාගැනීමට අප අපොහොසත් විය. එනිසා, ගිවිසුමේ 7.5 වගන්තිය ප්‍රකාරව කිසිඳු ප්‍රමාණය කරනලද අලාභයක් ගෙවීමට අප යටත් නොවේ. ගිවිසුමේ 7.5 වගන්තිය දක්වන්නේ:*

*7.5 මැඩලිය නොහැකි බලය (Force Majeure)*

| | | |
|---|---|---|
| *7.5.1* | *අර්ථ නිරුපණය* | *මෙකී ගිවිසුමෙහි කාර්යය සඳහා, මැඩලිය නොහැකි බලය (Force Majeure) යන්නෙන් පාර්ශවයක සාධාරණ පාලනයෙන් තොරව සිදුවන ක්‍රියාවක්/අවස්ථාවක් සහ අවස්ථානුකූලව ගිවිසුම යටතේ උද්ගතවන පාර්ශවයකගේ වගකීම් ඉටු කිරීම නොහැකිකරවන හෝ ප්‍රයෝගිකව ඉටුකිරීමට අපොහොසත් වන අවස්ථාවන් සලකනු ලබයි.* |
| *7.5.2* | *ගිවිසුම උල්ලංඝනය නොවීම* | *පාර්ශවයක් විසින් මෙකී ගිවිසුම යටතේ උද්ගත වන යම් වගකීමක් ඉටුකිරීමට අපොහොසත් වීම, එකී නොහැකියාව මැඩලිය නොහැකි බලය (Force Majeure) ක්‍රියාවක් මගින් උද්ගත වී ඇතිතාක් දුරට, මෙම ගිවිසුම උල්ලංඝනය කිරීමක් හෝ පැහැරහැරීමක් වශයෙන් නොසැලකිය යුතු ය ...* |

**5.** මිල්ටන් විශ්ව විද්‍යාලය සහ සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන් අතර ඇතිවූ ගිවිසුම අවසන් කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රශ්න පිළිබඳව උපකුලපතිවරයා ඔබගේ උපදේශය අපේක්ෂා කරයි.

a) ගිවිසුමේ මැඩලිය නොහැකි බලය (Force Majeure) පිළිබඳ වගන්තිය අදාල කරමින් සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන් ඉදිරිපත් කරන යාචනයෙහි කිසියම් වලංගුතාවක් පවතී ද?

**(ලකුණු 15)**

b) පාර්ශවයන්ට ගිවිසුම අවසාන කිරීම සඳහා සාමාන්‍ය තත්වයන් යටතේ පවතින වෙනත් ක්‍රම මොනවාද?

**(ලකුණු 10)**

**6.** ගිවිසුමක වගන්ති සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රශ්න පිළිබඳව උපකුලපතිවරයා ඔබගේ උපදේශය අපේක්ෂා කරයි.

a) ගිවිසුමක වගන්තියක් කෙසේ සහ කොතෙක් දුරට ගිවිසුමක ප්‍රතිඥා භාරයකින් වෙනස් වන්නේ ද?

**(ලකුණු 10)**

b) පහත දැක්වෙන ගිවිසුම් වගන්තිය මගින් සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන්හි නොසැලකිලිමත් ක්‍රියාවක් හෝ නොකරහැරීමක් මගින් උද්ගත වන්න වූ ද, රුපියල් මිලියනයක් ඉක්මවන්නා වූ ද, ඕනෑම හානියක් මගින් උද්ගත වන වගකීම බැහැර වන්නේද?

| | | |
|---|---|---|
| *11.1* | *බැහැර කිරීමේ වගන්තිය* | *ගිවිසුම්ක හෝ තෝරතමය වූ ද, කුමනාකාරයක හානියක් හෝ අලාභයක් වූ ද, සියලු සෘජු සහ අනුශාංගික අලාභ ද ඇතුලත්ව; අපගේ [සවුත් බැන්ක් කන්ස්ට්‍රක්ෂන්] උපරිම පූර්ණ වගකීම, ගිවිසුම්ක මිලට (රුපියල් මිලියනයකට) සීමා වෙයි.* |

**(ලකුණු 15)**

---හිමිකම් ඇවිරිණි---